# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාව
## ‘නිස්සය ප්‍රත්‍යය’
## 11.10.2018

නමෝත්‍ථස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝත්‍ථස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝත්‍ථස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේට දුක්ඛය සමුදය නිරෝධය මාර්ගය කියන්නා වූ චතුරාර්ය සත්‍යය ධර්මයන් පරෝපදේසයක් නැතිව ස්වයම්භූ ඥානයෙන් තමන්වහන්සේගේම සර්වඥතා ඥානයෙන් පිරිසිදු නුවණින් දැක දැන වදාළා වූ ශාන්ති නායක බුදුපියාණන් වහන්සේට අතීතයටත් අනාගතයටත් වර්තමානයටත් කියන කාල තුනටම සම්බන්ධ ස්කන්ධ ආයතනය ධාතු ඉන්ද්‍රිය පටිච්චසමුප්පාද ධර්මයන් චතුරාර්ය සත්‍යය ධර්මයන් කිසිම පැටලීමකින් තොරව පැහැදිලිව පිරිසිදුව අවබෝධ කොට ගත්තා වූ නාම ධර්මයන් වෙනම හඳුනා ගත්තා වූ නාම ධර්ම සංකලනය වෙනම හඳුනා ගෙන රූප ධර්මයන් වෙනම හඳුනා ගෙන නාම ධර්මයන්ගේ රූප ධර්මයන්ගේ වෙන වෙනම තිබෙන්නා වූ ලක්ෂණ වෙන වෙනම දැන අවබෝධකොට ගෙන නෙය්‍ය ජනයාට මහා කරුණාවෙන් පැහැදිලිව විසිතුරුව දේශනා කොට වදාළා වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

උතුම් වූ ශ්‍රී සත්ධර්ම රත්නයට බුදුරජාණන් වහන්සේ අවබෝධකොට ගත්තා වූ නිර්වාණ ධාතුව කියන උතුම් වූ ප්‍රනීත වූ ශාන්ත වූ ධර්මයටත් ඒ ධර්මය දක්වා දෙන්නා වූ මාර්ග ඵල ධර්මයන්ටත් ඒ මාර්ග ඵල ධර්ම නිර්වාණ ධාතුව අවබෝධ කරගන්න පිහිට වන්නා වූ උතුම් වූ ශ්‍රී සත්ධර්ම රත්නයට සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්ට ලොවුතුරා ශ්‍රී සත්ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ උතුම් වූ ශ්‍රී සත්ධර්ම මාර්ගයේ ගමන්කොට සසරින් මිදී ගියා වූ හේතු ඵල ධර්මයන්ගෙන් මිදී ගියා වූ දුක්ඛ ස්කන්ධයන්ගෙන් මිදී ගියා වූ ආශ්චර්ය පුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාර වේවා!

බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයට නමස්කාර කිරීමෙන් සහ එක මොහොතකට හෝ බුදුගුණ සිහිපත් කිරීමෙන් දහම් ගුණ සඟ ගුණ සිහිපත් කිරීමෙන් ලද කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙනුත් ත්‍රිවිධ රත්නයේ අනන්ත අපරිමාණ ගුණානුභාව බලයෙනුත් ලෝකයේ නොයෙක් ප්‍රදේශ වල දිසාවන්හි රැඳී කන් යොමුකොට හිත් යොමුකොට මේ ධර්මය අසාගෙන සිටින්නා වූ ශ්‍රද්ධාවන්ත ගුණවන්ත පින්වතුන් සිදු කර ගත්තා වූ සියලුම පුණ්‍ය ධර්මයන්ගේ කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් මේ පින්වතුන්ට අපි කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නා වූ මේ ධර්ම කරුණු ටික ඉතාමත්ම හොඳින් වැටහේවා! තේරුම් ගන්න ලැබේවා! අවබෝධ කරගන්න ලැබේවා! ඒ

සදහා කිසිම විදියකින් නීවරණ ධර්මයන්ගෙන් අකුසල ධර්මයන්ගෙන් බාධකයක් ඇති නොවේවා! සිහිය නුවණ ඉදිරිපත් කරගෙන සතියෙන් යුක්තව ශ්‍රද්ධාවෙන් යුක්තව හොදට අසාගෙන හිත යොදා මෙහෙයවාගෙන සැමදෙනාටම මේ ධර්මය මාර්ගයක් කොටගෙන චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගෙන උතුම් නිවනෙන් සැනසෙන්න ලැබේවා! නිර්වාණයට පිවිසීමට මේ උතුම් ධර්මය පිරිසිදු මාර්ගයක්ම වේවා! කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. ප්‍රර්ථනා කරනවා.

එසේ ප්‍රාර්ථනා කරමින් මේ පින්වතුන්ට මම අදට මේ වේලාවට ගැලපෙන්නා වූ ධර්ම කරුණු ටිකක් ඉස්මතු කරලා දෙනවා. තථාගතයන් වහන්සේගේ ධර්මයේ තිබෙන්නා වූ මූලික ගුණ තුනක් තමයි නැත්නම් ලක්ෂණ තුනක් තමයි 'අනිත්‍යය ධර්මය' 'දුක්ඛ ධර්මය' සහ 'අනාත්ම' කියන්නා වූ ධර්ම ස්වභාවය. ලෝකයේ තිබෙන්නා වූ ලෝකයට සම්බන්ධ සියලුම දේවල් අනිත්‍යයයි පෙරළෙන සුළුයි. නිත්‍ය නොවෙයි. මොහොතවල් දෙකක් එක විදියටකට පවතින්නේ නෑ කියන ධර්ම ස්වභාවය නිසාම ඒ තුල වින්දනය කරන්න, බාර ගන්න, සැපයි කියලා පිළිගන්න දෙයක් නැති බව කියන දුක්ඛ ස්වභාවය, අනිත්‍ය දුක්ඛ කියන ධර්මතා දෙක තිබෙන තැන කිසිම ආකාරයකින් අපිට මමය මාගේ කියලා ආත්මීය වශයෙන් වෙනස් නොවෙන්නා වූ ජීවියෙක් හැටියට බාර ගන්න දෙයක් නැතිබව කියන ආත්මයක් නැති බව කියන මෙන්න මේ කරුණු තුන හරි ගැඹුරුයි. මේ ගැඹුරු කාරණා තුන තේරුම් ගැනීමට විශේෂ ධර්ම පිටුවහලක් අපිට අවශ්‍ය වෙනවා. සත් පුරුෂ ආශ්‍රයක් අපිට අවශ්‍ය වෙනවා. ඒවගේම නියම ධර්ම පැහැදිලි කිරීමක් අපිට අවශ්‍ය වෙනවා. ඒක නිසා මේ අභිධර්ම විග්‍රහය ඔය කියන අනිත්‍ය දුක්ඛ අනාත්ම ධර්මයන් තේරුම් ගන්නත් පිටුවහලක් වෙනවා. විශේෂයෙන්ම මේවාගේ තිබෙන්නේ සත්ව ගතියක් නැති ධර්ම ස්වභාවයක් පමණයි, ජීව ගතියක් නැති ධර්ම ස්වභාව කොට්ඨාශයක් විතරයි මේවාගේ තිබෙන්නේ කියන බව තේරුම් ගැනීමට වටහා ගැනීමට මේ අභිධර්ම කථාව විසාල උපකාරයක් විසාල පිටුවහලක් වෙනවා. මේ අභිධර්ම කථාව මේ අභිධර්ම විස්තරය එවැනි සූක්ෂම ධර්ම විග්‍රහයක් හිතට ගන්න පුළුවන් මට්ටමක සිහියක් ඥානයක් තිබෙන්නා වූ අයට පමණක්ම ගැලපෙන්නා වූ දෙයක් කියන බවත් අපි තේරුම් ගන්න ඕනෑ.

ඒවාගේම තමයි යමක් තේරුම් ගන්න බැරිනම් තේරුම් ගන්න වටහා ගන්න අමාරුයි නම් ඒක තේරෙන්නේ නැති හිතට තෙහෙට්ටුවක් වෙන බවත් අපි දැන ගන්න ඕනෑ. යමක් අපිට වැටහෙන්නේ නැත්නම් තේරුම් ගන්න බැරිනම් ඒක අපේ මනසට යම් කිසි පීඩාකාරී ස්වභාවයක් තෙහෙට්ටු ගතියක් ඇති කරනවා, නොතේරෙන නිසා. නමුත් ඒ කාරණය තේරුම් ගන්න බැරි උනාය කියලා එවැනි දෙයක් නැතෙයි කියලා ප්‍රතික්ෂේප කර යෑම නොවෙයි එවැනි දෙයක් නෑ කියලා අයින්වෙන එක නොවෙයි කළ යුතු වෙන්නේ. 'මගේ නුවණ මගේ වැටහීමේ ශක්තිය මේ ධර්ම කොට්ඨාශයට තරම් බලවත් නෑ' කියන එක නිහතමානීව තේරුම් අරගෙන නිහතමානීව පිළිඅරගෙන වෙන ධර්ම කොට්ඨාශකට හිත යැවීම හෝ සත්පුරුෂයන්ගෙන් උදව්වක් උපකාරයක් ලබා ගැනීමට නිහතමානීව ඉදිරිපත් වීම හෝ තමයි කළයුතු වන්නේ.

මේ ධර්ම විග්‍රහයන් අපි හදලා කියන ඒවා නොවෙයි. මේ ධර්ම විග්‍රහයන් හොඳ ශ්‍රද්ධාවෙන් පිරිච්ච හිත් තිබ්ච්ච ඥානයෙන් මෝරපු හිත් වලට හොඳ පාරමී ගුණ ඇති සන්තාන වලට හිත් වලට දැනිලා ඒ සත් පුරුෂ උත්තමයන්ගේ ඒ ඥානයන්ගෙන් ස්පර්ශ කරලා බෙදලා විග්‍රහ කරලා මේවාට ගැලපෙන හිත් ඇති සත්පුරුෂයන්ට මේවා ඉතුරු කරලා තිබෙන්නේ. ඒක නිසා අතීතයේ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ තාවසිංස දිව්‍යලෝකයේ තව්තිසා භවනේ ශක්‍ර දේවේන්ද්‍රයන්ට අයිති පාණ්ඩුකම්බල ශෛලාසනයේ කරුණාවෙන් වැඩ හිඳගෙන උන්වහන්සේගේ අන්තිම ආත්ම භාවයට මනුස්ස ලෝකයේදී මාතෘත්වයෙන් පිහිට උනා වූ මාතෘත්වයෙන් උන්වහන්සේගේ අවසාන ජන්මය සිදු කරගන්න උපකාර උනා වූ මාතෘ දිව්‍ය පුත්‍රයා, තුසිත දෙව්ලෝකයේ උප්පත්තිය ලබපු ඒ මාතෘ දිව්‍ය පුත්‍රයා ප්‍රධාන කෙළ ලක්ෂගණන් දිව්‍යය සමූහයාට මේ ධර්මය දේශනා කරපු ඒ සත්පුරුෂ කල්‍යාණ මිත්‍ර බුදු රජාණන්වහන්සේට අපේ ගෞරව නමස්කාරය තිබෙන්න ඕනෑ. ඒවාගේම සාරිපුත්ත මහ රහතන්වහන්සේට සහ ඒ ශිෂ්‍ය පරම්පරාවට මේ ධර්ම විග්‍රය කිසිම විලෝපනයක් කරන්නේ නැතිව දිගින් දිගටම පවත්වාගෙන ආපු අද දක්වාම ඒ සඳහා ගෞරවයෙන් ඉදිරිපත් වෙලා කටයුතු කරන ඒ ස්වාමීන්වහන්සේලාට අපි බොහොම ගෞරව නමස්කාර පූර්වකව ඕනෑ මේ වැඩේ කරන්න.

අපේ තිබෙන දෘෂ්ඨිගත අදහස් මෝහයෙන් නොදන්නා කමින් මුලාවෙලා කරන ප්‍රකාශන මේවාට හේත්තු කරලා හරියට මහා මේරු පර්වතය ළඟ අබ ඇටයක් ගිහිල්ලා හේත්තු කරන්න වගේ මේ විසඳ වෙච්ච ඥාන ශක්තියක් ඇති උත්තමයන්ගේ හිත් වලින් ඥානයෙන් හසුරුවපු මේ ධර්මය කිසිවක් දන්නේ නැතුව ළද බොළඳ අදහස් එක්ක මේකට ගිහිල්ලා මේවා විග්‍රහ කරන්න ගියහම මහ විසාල පාපයක් අනර්ථයක් අකට යුත්තක් සිද්ධ කර ගන්නවා. ඒක නිසා නිහතමානීව ඕනෑ මෙතැනට යන්න. ඒ නිසා උන්වහන්සේලා කියලා තිබෙන දේවල් අපි බොහොම නිහතමානීව මාන්නයක් උපදවා ගන්නේ නැතුව සද්ධාව පෙරදැරි කරගෙන සසර දුකෙන් මිදී යෑමට උදව් කරගන්න මාර්ගයක්සේ සලකලා මේකට බහින්න ඕනෑ.

ඉතින් මේ දක්වාම අපේ පින්වතුන් එක්ක අපි මේ අභිධර්ම කථාව සාකච්ඡාව පවත්වාගෙන ආවේ මෙන්න මේ විදියේ පවත්වාගත්ත මනසක් එක්ක. නිහතමානී ශ්‍රද්ධාව පිරිච්ච මනසකින් තමයි හිතකින් තමයි මේක පවත්වාගෙන ආවේ. අපි විස්වාස කරනවා ඔන්න ඔය නිසාම තමයි අපි සැමදෙනාටම මේ දක්වාම මේ වැඩ සටහන සතියක් පාසාම දිගට කරගෙන එන්න ලැබිලා තිබෙන්නේ. ඒ තමයි ධර්ම ශක්තිය කුසල ශක්තිය ඒ බලය. මේ තුල යම් කිසි ව්‍යාජ ගතියක් රැවටිලි ගතියක් බොරු ගතියක් තිබුණා නම් ඒවාගේම මේ සාකච්ඡාවේ මේ දේශනාවේ මේ ධර්ම විග්‍රහයේ යම් කිසි රැවටිලි බොරු මිත්‍යා ගතියක් තිබුණා නම් මේ වැඩ සටහන් නැවතිලා එහෙම නම් බොහොම කල්. මේවා එසේ නොවුනේ මහා බලයක් නිසයි. මේවා එසේ නොවුනේ මහා ධර්ම ශක්තියක් නිසයි. කිසි කෙනෙකුට චෝදනාත්මකව ඇඟිල්ලක් දික් කරන්න බැරි ධර්ම විග්‍රයන් මේවාගේ තිබෙන්නේ. අපි නැමදීමෙන් ඒවා විස්තර කළා අපේ හිත්

වලට ගලපා ගන්න. ඒ නිසා මේ පින්වතුන් සැමදෙනාම සන්තෝස වෙන්න. විසාල පිරිසක් නැති උනත් ගැලපෙන හිත් සමුදායක් එක්කාසු කරගෙන මේ ධර්ම කථාව අපි කරගෙන යනවා. මේ තමයි අපිට ඕනෑ දේ. මේ තමයි අපිට හිතන්න ඕනෑ දේ. මේ තැන තමයි අපිට හොයන්න ඕනෑ තැන. ඒකයි අපි මේ දේ සිද්ධ කරන්නේ. මේක සිද්ධ කරන්නේ අනුන් සතුටු කරන්න නොවෙයි. මේ අභිධර්ම කථාව අභිධර්ම සාකච්ඡාව අපි කරන්නේ තවත් කෙනෙකුට ඕනෑ හින්ද නොවෙයි, අපිට ඕනෑ හින්දයි. තවත් කෙනෙක් සතුටු වෙන්න නොවෙයි, අපිට සතුටු වෙන්නයි. තවත් කෙනෙක් නිවනින් නිවා දාන්න මාර්ගයක් හැටියට නොවෙයි, අපිට නිවී යන්නයි. අපේ දිහා බලලා කෙනෙක් එනවා නම් සතුටුදායකයි. නැත්නම් ඒ අයට වෙනත් මාර්ගයක් ලැබේවි. ඒක නිසා මේ අභිධර්ම කථාවෙන් විශේෂයෙන්ම අපිට තිබෙන පිටුවහල තමයි ආත්ම සංඥාව කඩන එක. ආත්මයක් නෑ ජීවයක් නෑ කියන එක තේරුම් ගැනීමටයි අවශ්‍යය. ඒක හරිම අමාරුයි. දෙවියන්ටත් බ්‍රහ්මයන්ටත් ආත්ම සංඥාව කැවෙනවා. යමක් තිබෙනවා කියන හැඟීම එනවා. බුදුරජාණන් වහන්සේ අර බක බ්‍රහ්මයාටත් දේශනා කළා ආත්මයක් ජීවයක් කෙනෙක් නෑ කියලා. ඒක ඒ තරම් ගැඹුරුයි. දෙවියන්ටත් මේක බලපානවා.

මතක ඇති සාති කියලා භික්ෂුවක් හිටියා. ඒ භික්ෂුවටත් ආව දෘෂ්ඨියක්. ඒ තමයි නොවෙනස්ව මෙතැනින් එහාට, එතැනින් තවත් තැනකට මාරු වෙන්නා වූ ගමන් කරන්නා වූ නොවෙනස් වෙන විඤ්ඤාණයක් තිබෙනවා කියලා මහා මිත්‍යා මතයක් ආවා දෘෂ්ඨියක් ආවා. හරි භයානකයි. ඔහොම එන්නේ ස්ථාවර දෙයක් තිබෙනවා කියන හැඟීමත් එක්ක. ඕක කඩාගන්න අමාරුයි. ඒක කඩාගන්න බැරි හින්දම තමයි සංසාරයේ රැදෙන්නේ. ඔය ආත්ම සංඥාව තදින් තිබෙන නිසා තමයි, ඒක තේරුම් ගන්න බැරි නිසා තමයි ඒක වටහා ගන්න බැරි නිසා තමයි, එහෙම දෙයක් නෑ කියලා ඒකට ඇතුල් වෙන්න බැරි හින්දා තමයි සමහර වේලාවට වචන වල අර්ථ වෙනස් කරලා ඒවාගෙන් හිතට පැන ගන්න යන්නේ. ඒ නොතේරෙන නිසයි. නොදන්නා නිසයි. වටහා ගන්න අමාරු නිසයි. මේ පින්වතුන් හොඳට ඇස් යොදලා ඇස් ඇරලා නුවණ යොදලා බලන්න. අනාත්මය කියන එක තේරුම් ගන්න බැරි නිසා ආත්මයක් නෑ කියන එක තේරුම් ගන්න බැරි නිසා අනන්ත කියන එකට තමන් අර්ථයක් හයි කරගෙන අනර්ථයි කියලා ඒ විදියට මේක තේරුම් ගන්න යනවා. ඇයි එහෙම කරන්නේ? අනන්ත කියන එකේ තිබෙන්නේ නොවෙනස් වෙන ආත්මයක් නෑ කියන එකයි. ඒක වැටහෙන්නේ නැතිකොට ඒක තේරෙන්නේ නැතිකොට ඒක හිතට ගලපා ගන්න බැරිවෙනකොට ඒක තේරුම් ගන්න වටහා ගන්න සුදුසු ඥානයක් ශක්තියක් බලයක් ප්‍රඥාවක් නැතිවෙනකොට ඒක තේරුම් ගන්න සත්පුරුෂ ආශ්‍රයක් සොයා යන්නේ නැතුව ඒකට පිහිට වෙන ධර්ම ස්පර්ශයක් කරන්නේ නැතුව ඒ අය කරන්නේ අනන්ත කියන වචනය වෙනස් කරනවා. ඒකට දානවා අනර්ථය කියලා. ඒකෙන් මේක තේරුම් ගන්න බෑ. වැටහෙන්නේ නෑ. ඒ නිසා මේ අනාත්මය කියන එක තේරුම් ගන්න මහෝපකාරී වෙන ඉතාමත්ම උපකාර වෙන ධර්ම විග්‍රහයක් තමයි මේ අභිධර්ම විග්‍රහය. මේකට වෙන වචන කෑලි හයි කරලා තේරුම් ගන්න බෑ. මේකට වචන වෙන වෙන ඒවා දාන්න ආපු අය ඒ වචනත් එක්කම හැලිලා හෝදා පාළු වෙලා යනවා. ඕකයි සිද්ධ වෙන්නේ. මේ

ධර්මයට ඇවිල්ලා ධර්මයේ තිබෙන වචනයට ගරු කරලා ධර්මයේ තිබෙන ධර්ම අර්ථයට ගරු කරලා ඒක තේරුම් ගන්න සීල සමාධි ප්‍රඥා සිහිය නුවණ භාවිතා කරනවා ඇරෙන්න ඒකට වෙන වෙන තමන්ගේ දෘෂ්ඨී ගෙනැල්ලා හේත්තු කරනකොට වෙන්නේ තමන්ගේ දෘෂ්ඨීයත් එක්කම තමනුත් තමන්ගේ පිටි පස්සේ එල්ලිච්ච අයත් ඔක්කොම ටික නාය ගියා වගේ හෝදා පාළු වෙලා කඩා හැලෙන එක තමයි සිද්ධ වෙන්නේ. ඒක තමයි ධර්ම ශක්තිය. ඒක තමයි ධර්ම බලය. ඒක තමයි ධර්මයේ ස්වභාවය. මේ පින්වතුන් හැම කෙනාම ඕවට ගියේ නැති නිසා බොරුවට වංචාවට දෘෂ්ඨියට අහුවෙච්ච නැති නිසා ඒවාගේම අවංකවම ආත්ම සංඥාව කඩා ගන්න ඕන නිසා මේ විග්‍රහයට ඇහුම් කන් දීම නිසා තමයි අද මේ පින්වතුන්ට අවුරුදු ගානක් තිස්සේ නිහතමානීව ශ්‍රද්ධාවෙන් මේ වැඩේ මේ විදියට කරගෙන එන්න ලැබිලා තිබෙන්නේ.

මේ ටිකත් එක්ක මම මේ කියාගෙන ආවේ පට්ඨාන ධර්ම කථාවේ ආරම්භයේදීම මම කිව්වා පට්ඨානය කියන එකේ තේරුම මොකක්ද කියලා. පට්ඨානය කියන වචනයේ තේරුම් ගෞරවාන්විතව අපි මතක් කළා. බහු හේතු නිසා ඒවාගේම නොයෙක් කරුණු කාරණා යෙදෙන හින්දා පට්ඨාන ධර්ම යෙදෙන ආකාරය අපි මතක් කළා. ඒ පට්ඨානයේ කරුණු කරණා 24 තිබෙනවා. ඒ 24 තමයි අපි මේ ගලපාගෙන ගලපාගෙන යන්නේ.

පට්ඨාන ධර්ම 24 මේ අවස්ථාවේදී අපි කියන්නේ **නිස්සය ප්‍රත්‍යය** ගැනයි. නිශ්‍රය කියන්නේ කුමක් දැයි කියලා අපි කිව්වා. යම් කිසි දෙයකට හිටින්න පිහිටන්න මතුවෙන්න යමක් උපකාර වේද ආන්න ඒකට කියනවා නිශ්‍රය ගතිය කියලා. අපේ පින්වතුන් මේක හොඳට හිතේ කවා ගන්න ඕනෑ. හොඳට හිතේ වද්ද ගන්න ඕනෑ. හොඳට හිතේ රඳවා ගන්න ඕනෑ. උපමා විග්‍රය හරිම පිටුවහලක් වෙනවා. උපමාවක් ආශ්‍රයෙන් ධර්ම කාරණයක් තේරුම් ගන්න යනවා කියන්නේ ඒක හරි උපකාරයක් වෙනවා.

නිශ්‍රය ප්‍රත්‍යය අපි මෙහෙම තේරුම් ගනිමු. ඒ තමයි යම් කිසි කඩදාසියක චිත්‍රයක් තිබෙනවා. ඒ කඩදාසියේ චිත්‍රය ඇදෙන්න ඒ චිත්‍රය පිහිටන්න කඩදාසිය උපකාර වෙනවා. කඩදාසි තමයි චිත්‍රය ඇදෙන්න පිහිටන්න භූමියක් වෙච්ච උපකාරයක් වෙච්ච නිශ්‍රය ස්වභාවය දක්වන වස්තුව. කඩදාසිය නැත්නම් ඒ පිංතූරය නෑ. අපි පිංතූරය දිහා බලනකොට බලන්නේ කඩදාසිය නිසා නොවෙයි ඒ පිංතූරය දිහා. හැබැයි ඒ පිංතූරය තිබෙන්නේ කඩදාසියේ. ඔය වගේ තමයි යම් කිසි දෙයක් මතු වෙන්න පිහිටන්න හිටින්න උපකාර වෙන දේට කියනවා නිශ්‍රය ධර්මය, නිශ්‍රය වස්තුව කියලා.

ඊළඟට අපි කිව්වා නිශ්‍රය වෙන විදිය. බලන්න භාවනා අනුසාරයෙන් බුදුරජාණන් වහන්සේගේ තිබිච්ච ලස්සනම විසිතුරුම චින්තන ක්‍රමය උන්වහන්සේ ධර්මය අරමුණු කරන විදිය බැලුවහම ඉතාම පැහැදිලියි. ඉතාම පිරිසිදුයි. ඉතාම ලස්සන උතුම් ගතියක් තිබෙනවා. සැරියුත් මහා රහතන්වහන්සේගේ ධර්ම විග්‍රය හොඳ ලස්සනට ගැලපෙනවා තථාගතයන් වහන්සේගේ හිතට. බලන්න මේ කථාව. නාම ධර්ම කියලා කොට්ඨාසයක් තිබෙනවා, හිතත් චෛතසික ධර්මත්. අනිත් අතට කිව්වොත්

විඤ්ඤාණයයි වේදනා සංඥා සංඛාර කියන තුනයි තමයි නාම ධර්ම ටික. බුදුරජාණන්වහන්සේ කවදාකවත්ම රූප ධර්ම වලට පටලවා ගන්නේ නෑ. රූප ධර්ම ටික වෙනම හොඳට බලනවා. රූප ධර්ම වල තිබෙන ලක්ෂණය හොඳට දකිනවා. නාම ධර්ම වෙනම හොඳට දකිනවා. හොඳට බලනවා. නාම ධර්ම වල තිබෙන්නා වූ විවිධ නාම ධර්ම වෙනම බලනවා. විඤ්ඤාණය වේදනාවට වෙනස්. වේදනාව සංඥාවට වෙනස්. සංඥාව සංස්කාරයන්ට වෙනස්. මේ කියන්නා වූ නාම ධර්මයන්ගේ විවිධත්වය නිසා උන්වහන්සේ වෙනම වෙනම ඒ නාම ධර්ම ටික හොඳට දැන ගත්තා. නාම ධර්මයන්ගේ තිබෙන්නා වූ එකිනෙකාට තිබෙන හිතවත් කම උපකාරක ගතිය නිශ්‍රය ස්වභාවයත් බුදුරජාණන් වහන්සේ හොඳට දකිනවා. හැබැයි ඒ නාම ධර්ම රූප ධර්ම වලට පටලවා ගන්නේ නෑ. රූප ධර්ම බලනකොට ඒ රූප ධර්මයන්ගේ වෙනස් වෙනස් රූප ධර්ම දකිනවා. මහා භූත රූප 4 ක් තේරුම් ගන්නේ ලක්ෂණ 4කින් යුක්ත වෙච්ච හතර ආකාර රූප ස්වභාවයක් තිබෙන හින්දා. එහෙම නැත්නම් හතරක් නොවෙයි ඔක්කොම එකයි කියලා කියනවා. රූප හතරක් වෙන්නේ රූප ධර්ම ස්වභාව හතරක් තිබෙන නිසා. ඒ රූප ධර්ම ස්වභාව හතරෙන් උපාදාය රූප කොටසක් කියලා තිබෙන නිසයි තව කොටසක් හඳුනා ගන්නේ.

බලන්න කොච්චර විසිතුරු කොච්චර ලස්සන ඉතාමත්ම ප්‍රනීත ඉතාමත්ම නිවැරදි හොඳ පිරිසිදු සිහියකින් නුවණකින් තථාගත ඥානයෙන් ඒ නාම ධර්ම පැත්ත දැක අවබෝධ කරගත්තාද කියලා. රූප ධර්ම පැත්ත පැහැදිලිව පිරිසිදුව අවබෝධ කරගත්තාද කියලා බලන්න. බුදුරජාණන් වහන්සේගේ නුවණේ පිරිසිදු කම බලන්න. නාම ධර්ම කොටස් කර ගත් ආකාරය බලන්න. වේදනාව වෙනම, සංඥාව වෙනම, සංස්කාරය වෙනම, විඤ්ඤාණය වෙනම. ඊළඟට බලන්න රූපය පැත්ත. මහා භූත සහ උපාදාය රූප බලාගත්තු හැටි බලන්න. ඔය නාම රූප ස්වභාවයන්ගේ හැටි. ඔය විතරක් නොවෙයි. මේවා වෙන වෙනම හේතු වලින් හටගන්නා විදියත් උන්වහන්සේ අවබෝධ කරගත්තා. නාම ධර්ම හටගන්නේ එක විදියකින්. රූප ධර්ම හටගන්නේ එක විදියකින්. ඊළඟට නාම ධර්මයන්ටත් රූප ධර්මයන්ටත් හේතු වෙන දේවල් අවබෝධ කරගත්තා.

රූප පහළ වීමේදී, රූපයක් හට ගැනීමේදී අවස්ථා තිබෙනවා. ඒ අවස්ථාවල් හරි පැහදිලිව පිරිසිදුව තේරුම් ගත්තා, පළවෙනි අවස්ථාවෙන් දෙවෙනි අවස්ථාවට පටලවා ගන්නේ නැතිව. ඒ තමයි තථාගත ඥානයේ තිබෙන විසිතුරු ගතිය. එකක් තමයි ප්‍රතිසන්ධි අවස්ථාව. ඊළඟට ප්‍රවෘත්ති අවස්ථාව. ඊළඟට ඒ අවස්ථාවේ රූප හැදෙන විදිය. මතු වෙන විදිය. ප්‍රවෘත්ති අවස්ථාවේ රූප හැදෙන මතුවෙන විදිය. ඊළඟට ඇසෙන් රූපයක් දකිනකොට එතැන රූප හැදෙන විදිය. කනෙන් ශබ්ද අහනකොට එතැනින් රූප මතුවෙන විදිය. නාසයෙන් ගඳ සුවඳ දැන ගන්න කොට එතැනින් රූප හැදෙන විදිය. දිවෙන් රස ගන්නකොට එතැන රූප හැදෙන විදිය. කයෙන් සපර්ෂ ලබනකොට එතැන රූප හැදෙන විදිය. ඊළඟට හිතෙන් යමක් සිතනකොට එතැන රූප සකස් වෙන විදිය. හොඳට මේවා එකින් එකට පටලවා ගන්නේ නැතුව නිවැරදි ව්‍යාකූල නොවූ පැහැදිලි පිරිසිදු හිතකින් බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගත්තා. උන්වහන්සේගේ නිවැරදි

පිරිසිදු ගමන් මගේ වැඩම කළා වූ සාරිපුත්ත මහරහතන් වහන්සේට ඒ අවස්ථාවල් වෙන වෙනම වැටහෙනවා. ඔය අවස්ථාවල් වෙනම හඳුනා ගත්තා. ඊළඟට ඒ අවස්ථාවලදී පහළ වෙන රූප වල මතු වීමට හේතුවෙන කර්ම ශක්තිය හේතුවක් හැටියට වෙනම දැන ගත්තා. චිත්තය චිත්තජ රූපයන්ට හේතු වෙන ආකාරය වෙනම පැහැදිලිව දැන ගත්තා. ඊළඟට ඍතු ගුණය රූප පහළ වෙන්න හේතුවක් වූ ආකාරය වෙනමම අවබෝධ කරගත්තා. ආහාරය රූප හැදෙන්න හේතුවක් වෙන ආකාරය වෙනම දැන ගත්තා. ඊළඟට කර්මයෙන් හැදිච්ච රූපයන් නොවෙයි චිත්තජ රූප කියන්නේ, චිත්තයෙන් හැදිච්ච රූපයන් නොවෙයි කර්මජ රූප කියන්නේ, ආහාරයෙන් හැදිච්ච රූපය නොවෙයි කර්මජ රූප සහ චිත්තජ රූප කියන්නේ, ඍතුවෙන් හැදිච්ච රූප නොවෙයි ආහාරජ රූප වෙන්නේ කියලා වෙනම දැන ගත්තා. ඒවාගේම මේ රූපවල එක සමාන ගති තිබුණාට මතු වෙන හැදෙන ස්ථාන වෙනයි කියලා තේරුම් ගත්තා. බලන්න නිරවුල් සිතේ තිබෙන විසිතුරු කම. ව්‍යාකූල නොවූ සිතේ තිබෙන ලස්සන ගතිය.

අඹ වර්ග හතරක් තිබෙනවා. අපි කියනවා කොහු අඹ, රට අඹ කියලා. තවත් අඹ ජාතියක් තිබෙනවා කර්ත කොළම්බන් කියලා. මේවා අඹ උනාට කොහු අඹ ගහේ නොවෙයි පැණි අඹ හැදෙන්නේ. පැණි අඹ ගහේ කර්ත කොළම්බන් හැදෙන්නේ. ඒවා අඹ උනාට ඒවා හැදෙන ගහ වෙනස්. නාමික වශයන් රස වශයෙන් ඒ හැඩය වශයෙන් අඹ ගෙඩි වල සමාන කම් තිබෙන්න පුළුවන්, නමුත් හැදෙන තැන වශයෙන් වෙනස්. රූපත් ඔය විදියයි. ඒවා හැදෙන තැන වශයෙන් වෙනස් මූලයන් තිබෙන්නේ. කර්මයෙන් හැදෙන රූප තිබෙනවා අපේ ශරීරයේ. හිතින් හැදෙන රූප තිබෙනවා අපේ ශරීරයේ. ආහාරයෙන් හැදෙන රූප තිබෙනවා අපේ ශරීරයේ. ඍතුවෙන් හැදෙන රූප තිබෙනවා අපේ ශරීරයේ. මේ ශරීරයේ වර්ග හතරක රූප තිබෙනවා. හැබැයි ඒ රූප ඒ විදියට උනාදෝ කියලා තේරුම් ගැනීමට වටහා ගැනීමට අවබෝධ කරගැනීමට වෙනස්ව වෙනස්ව ගලපා තේරුම් ගන්නට අපිට එක දෙයක් අඩුයි. ඒ තමයි ඒක වෙන් කරගන්න නුවණ. ඒක වෙන් කරගන්න ඥානය. ඒක වෙන්කර ගන්න ප්‍රඥාව. ඒක නිසා මේ අභිධර්ම විග්‍රය පිහිට වෙනවා ඒවා කඩා ගන්න, වෙනස් කරගන්න, කොටස් කරගන්න. ආත්ම සංඥාව නැතිකර ගන්න පාරක් මේක.

මේ නිශ්‍රය ප්‍රත්‍යය ගැන කියනකොට ඔන්න ඔය ටික තේරුම් ගන්න ඕනෑ. 'කර්මජ රූප' 'ඍතුජ රූප' 'චිත්තජ රූප' 'ආහාරජ රූප'. එතකොට තමයි මේ විග්‍රය තේරුම් ගැනීම ලස්සන වෙන්නේ, ප්‍රනීත වෙන්නේ. නිරවුල් වෙන්නේ. එහෙම නැත්නම් පැයක් එකහමාරක් විතර වචන ටිකක එක්තරා රැදිච්ච බවක් විතරයි තිබෙන්නේ. අපි අපේ හිත් වලින් නුවණින් සිහියෙන් ආන්න ඒ වෙනස් කම තේරුම් ගන්න මේ වේලාවේ මහන්සි වෙන්න ඕනෑ. හිත යොදන්න ඕනෑ. ඒක බණ ඇසීමකුත් වෙනවා, මෙනෙහි කිරීමකුත් වෙනවා, භාවනාවකුත් වෙනවා. ඒක නිසා මේ නිශ්‍රය ප්‍රත්‍යය ගැන ඔය ටික අපි හොඳට තේරුම් ගන්න ඕනෑ.

අපි මතක් කරපු විදියට අපේ ශරීරයේ තිබෙනවා **චිත්තජ රූප** කියලා ජාතියක්. හොඳට දැනගන්න. **කර්මජ රූප** කියල රූප තිබෙනවා. කර්මජ රූප ප්‍රතිසන්ධි අවස්ථාවේ

තමයි ආරම්භ කරන්නේ. ඒක නිසා ඒ අවස්ථාවයි රූපයි වෙනම කියනවා **ප්‍රතිසන්ධි කර්මජ රූප** කියලා. ඒ විතරක් නොවෙයි රූප වල තව තිබෙනවා අපේ ශරීරයට අයිති නැති **බාහිර රූප** කියලා කොටසක්. ඊළඟට **අහාරජ රූප** කියලා කොටසක් තිබෙනවා. **ඍතුජ රූප** තිබෙනවා. ඒ විතරක් නොවෙයි **ප්‍රවෘත්ති කාලයේ කර්මජ** රූප තිබෙනවා. සාමූහිකව ගත්තයින් පස්සේ අසංඥ තලයේ සත්වයන්ට පිහිටි **අසංඥ සත්ව කර්මජ රූප** ස්වභාවයක්. ඔය කියන්නාවූ **රූප වර්ග හතක්** කරගත්තේ මේකට පිටුවහලක් වෙන නිසයි, තේරුම් ගැනීමට. සංඛ්‍යා පිරීමට නොවෙයි. දැන් අපි එක එක කොට්ඨාශ කියාගෙන කියාගෙන ආව. මේ මම කියපු ටික මේ පින්වතුන්ට තරමක තේරුම් ගැනීමක් වෙන්න ඇති කියලා මෙහෙ ඉඳගෙන මම විස්වාස කරනවා.

අපි දැන් කතා කරන්නේ **නිස්සය ප්‍රත්‍යය** ගැනයි. යමක් උපදින්න යමක් ඇතිවෙන්න යමක් මතුවෙන්න යමක් පිහිටන්න හේතු වෙන ආධාර වෙන දේට කියනවා නිස්සය ප්‍රත්‍යය කියලා. මේ පින්වතුන් ගාව අපි හිතමු කිරි පිටි ටින් එකක් තිබෙනවා කියලා. ඒ පිටි ටින් එකේ සඳහන් වෙලා තිබෙනවා ටින් එක ඇතුලේ තිබෙන්නා වූ පිටි වලට කියන්නා වූ නම. ඒ නම තිබෙන්නේ පිටි අස්සේ නොවෙයි. ඒ නම තිබෙන්නේ ටින් එක පිටතින්. ඒ නම රැඳී තිබෙන්න ටින් එක ආධාර වෙනවා. නම පිහිටා තිබෙන්නේ ටින් එකේ වටේ. ඒ ටින් එක එක වේලාවේදීම නිශ්‍රය ස්වභාව දෙකක් කරනවා. හොඳට හිතන්න. එකක් තමයි ඒ ටින් එක පිට පැත්තේ අකුරු ටික පිහිටා සිටීමට, මොකක් හරි පින්තූරයක් තිබෙනවා නම් ඒක පිහිටා සිටීමට නිශ්‍රය වෙනවා. හේතු වෙනවා. පිහිට වෙනවා. උපකාර වෙනවා. කාටද ඕක නෑ කියන්න පුළුවන්? අනිවාර්යෙන්ම තිබෙනවා.

ඒ අකුරු ටික නිසා නොවෙයි ටින් එක තිබෙන්නේ. ටින් එක නිසයි අකුරු තිබෙන්නේ. ඒක නිසා නිශ්‍රය භාවය තිබෙන්නේ ටින් එකෙයි, අකුරු වල නොවෙයි. ඒ නිශ්‍රය ගතිය ඒ පිහිට ලබන්නේ අකුරු ටිකයි. ඔන්න ඔය ගතිය තේරුම් ගන්න. අනිත් එක තමයි එකම වේලාවේදී තවත් නිශ්‍රය ගතියක් තිබෙනවා. ටින් එක ඇතුලේ තිබෙනවා පිටි. පිටි ටික පිහිටා තිබෙන්නේත් ටින් එක නිසයි. පිටි නිසා නොවෙයි ටින් එක තිබෙන්නේ. ටින් එක නිසා තමයි පිටි තිබෙන්නේ. ඒක නිසා මේ පින්වතුන් හොඳට තේරුම් ගන්න එක වෙලාවේදී මේ ටින් එක නිශ්‍රය ගති දෙකක් දක්වනවා. පිහිට වීම් දෙකක් දක්වනවා. ඒ තමයි ටින් එකේ අකුරු ටිකට පිහිටා සිටීමට නිශ්‍රය වෙනවා. ටින් එක ඇතුලේ තිබෙන පිටි ටික පිහිටා සිටීමට නිශ්‍රය වෙනවා. උදාහරණයක් මේ කිව්වේ. එක වේලාවකදී එක ධර්මයක් එකකට නොවෙයි තවත් දෙක තුනකට හතර පහකට නිශ්‍රය වෙනවා, පිහිට වෙනවා. හැබැයි එහෙම උනාට ඒක එහෙම වෙනවද කියලා තේරුම් ගන්න සාමාන්‍ය කෙනෙකුට නුවණක් වැටහීමක් සලසා ගන්නවා කියන එක හරි අමාරුයි. තථාගත බුදුරජාණන් වහන්සේගේ ඒ උතුම් වූ සියුම් වූ දක්ෂ වූ නිකෙලෙස් වූ පාරමී ගුණයන්ගෙන් පිරී ඉතිරී පැවතුනා වූ ඒවාගේම සමාධි ගුණයෙන් පිරී ඉතිරී ඒ සමාධියේ පිහිටා සිහියෙන් ඔද වැඩී තෙද වැඩී සද්ධාවෙන් ඔද වැඩී තෙද වැඩී ප්‍රභාෂ්වර උනා වූ පිරිසිදු උනා වූ අති අලංකාර උනා වූ ඒ උතුම් ඥානයට ඒ පිරිසිදු ඥානයට මේකේ තිබෙන්නා වූ වෙනස, මේකේ තිබෙන වෙනස් වෙනස් ආකාර, එක වෙලාවට එක

ධර්මයක් නිස්සය වෙනවා තවත් ධර්ම ගානකට කියලා විසාල ප්‍රමාණයකට නිශ්‍රය වෙනවා උපකාර වෙනවා කියන එක හොඳට බුදුරජාණන්වහන්සේගේ නුවණට තේරුණා. මේ නිශ්‍රය කියන එක තේරෙන්නේ නැතුව වටහා ගන්නේ නැතුව අනිත් ඒවා වචනත් එක්ක යනකොට ටිකක් කෙනෙකුගේ හිතට අමාරුවක් වෙනවා. ඒක ග්‍රහණය කරගන්න බෑ. මම මෙච්චර හරියක් මේ කියන්නේ ටිකක් හෝ ඒවා හොඳට වටහා ගන්නයි.

තවත් මේ කාරණය හොඳට හිතලා බලන්න. වස්තුවක් විසාල පිරිසකට විසාල ධර්ම රාශියකට පිහිට වෙනවා එක වේලාවේදී. එක පවුලක ඉන්නවා ළමයි දහ දෙනෙක්. ඒ ළමයි දහ දෙනයි අම්මයි තාත්තයි ඔක්කොම දොළහයි. ළමයි දහ දෙනාගෙන් එක්කෙනෙක් දොස්තර මහත්තයෙක්. එක්කෙනෙක් ඉංජිනේරු වරයෙක්. එක්කෙනෙක් professor කෙනෙක්. අනිත් එක්කෙනා ගුරුවරයෙක්. ඒවාගේම අනිත් අයත් එක එක රස්සාවල් කරගෙන ඉන්නවා. දැන් බලන්න මේ අම්මා දරුවෝ දහ දෙනාට එකම වෙලාවේ අම්මා වෙනවා. වෛද්‍යවරයාගේත් අම්මා වෙනවා. ඊළඟට ඉංජිනේරුවාගේත් අම්මා වෙනවා. Professor ගෙත් අම්මා වෙනවා. ගුරුවරයාගේත් අම්මා වෙනවා. අනිත් ළමයි හය දෙනාගේත් අම්මා වෙනවා. එකම වෙලාවේ, අවස්ථා දෙකක නොවෙයි. එතකොට මේ කාන්තාවගේ මේ අම්මා කියන ගතිය එකම වේලාවේ ඒ මාතෘත්වය දහ දෙනෙකුට නිශ්‍රය වෙනවා. ඒක නිසා අවස්ථා දහයක නොවෙයි මේ අයට අම්මා වෙන්නේ, එකම වෙලාවේ. ඔය දහ දෙනාම එකට අම්මා කියලා කථා කළොත් එක්කෙනයි අමතන්නේ. ඒවගේ එක ධර්මයක තිබෙනවා විසාල ධර්ම ස්වභාවයකට එකම වෙලාවේ නිශ්‍රය වෙන ගතිය. මේක හොඳට තේරුම් ගන්න.

තවත් හිතන්න. මම මේ මෙච්චර කියන්නේ මේ කියාගෙන යන කථාවේ ඔහොම හරඹයක් තිබෙනවා. ඔහොම විස්තරයක් තිබෙනවා. කැන්වස් එකක් තිබෙනවා. ඒ කැන්වස් එකේ පිංතූරයක් තිබෙනවා. ඒ පිංතූරයේ තිබෙනවා ගෙයක්. ඒකෙ ඉන්නවා මනුස්සයෙක්. ඒකෙ තිබෙනවා කරත්තයක්. ඒකෙ ඉන්නවා බල්ලෙක්. කුරුල්ලෙක් ඉන්නවා. ඒවාගේම ගහක් තිබෙනවා. මේ කියන්නා වූ පිංතූර ටිකට ඒ ගෙට ළමයට මනුස්සයාට බල්ලට ගහට කරත්තයට යන මේ සෑම රූපයකටම, ඒ පිංතූර ටික ඔක්කෝටම එකම වේලාවේම තමයි කැන්වස් එක පිහිට වෙන්නේ. අවස්ථා දෙහෙක නොවෙයි. ආන්න ඒ ගතිය මේකේ තිබෙනවා.

තථාගතයන් වහන්සේගේ බුදු නුවණ බුදුරජාණන් වහන්සේගේ බුදු නුවණ දිහා බලන්න. කොච්චර පැහැදිලි විදියට එක වේලාවකදී එකක් විසාල නාම ධර්ම සමූහයකට පිහිට වෙන ගතියක් තිබෙනවා ද පිහිට වෙන ස්වභාවයක් ලක්ෂණයක් තිබෙනවාද කියලා හොඳට හිතන්න. මේ ධර්මය කාටද නෑ කියන්න පුළුවන්. මේ ධර්මය කාටද බොරු කරන්න පුළුවන් කම තිබෙන්නේ. මේ ධර්මය කාටද කණපිට ගස්සන්න පුළුවන් කම තිබෙන්නේ නැතෙයි කියලා. අඥානයකුගේ ඊර්ෂ්‍යාකාර මෝඩ අදහසකින් වචන හරඹයකට ඉදිරිපත් වෙනවා ඇරෙන්න ඇත්ත වශයෙන්ම මේ ධර්මය ඔහොම නොවෙයි කියලා ධර්මය අර්ථ වශයෙන් වෙනස් කරන්න කාටවත් බෑ. දෙවි කෙනෙකුට බෑ.

බ්‍රහ්මයකුට බෑ. මාරයෙකුට බෑ. කිසිකෙනෙකුට අත ගහන්න බෑ. ඒ තරමම සජීවී පැහැදිලි පිරිසිදු ධර්ම ස්වභාවයක් මේකේ අස්සේ තිබෙනවා. ඔය නිශ්‍රය ගැන ඔන්න ඔය ටික දැන ගන්න ඕනෑ.

දැන් මම වාක්‍යයක් කියනවා. ඒ වාක්‍ය පාලි භාෂාවෙන් තිබෙන්නේ. පාලි භාෂාවට ගෞරවයෙන් ඉතාම නමස්කාර පූර්වකව ගෞරවයකින් තමයි මේ වාක්‍යය කියන්නේ. බුදුරජාණන් වහන්සේ නිරුක්ති දක්වන්න පාවිච්චි කරපු නිර්මල වූ පැහැදිලි වූ වෙන වෙන දේවල් කථා කරන්න භාවිතා නොකරපු ඉතාම හොඳ භාෂාවක්. හොඳ ලස්සන වාග් විලාසයක් ඕකේ තිබෙන්නේ. ඒක නිසා ලෝකයට මේ ආර්ය ධර්මය කියා පාන්න බුදුරජාණන්වහන්සේ උතුම් විදියට මේ භාෂාව පාවිච්චි කරනවා. ඒ භාෂාවේ මෙහෙම තිබෙනවා.

## 7 වෙනි වීථිය.

1) **විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං නිස්සයපච්චයෙන පච්චයො** කියලා කථාවක් තිබෙනවා.

   මෙතැනදී **විපාකාබ්‍යාකතය** කියලා කියන්නනේ ඉස්සරවෙලා කළාවූ කුසල හරි අකුසල හරි කර්ම ශක්තියක බලයක් නිසා මේ වෙලාවේ පහළ වූ විපාක ගතියකට කියනවා විපාක අව්‍යාකෘතය කියලා. **කිරියාබ්‍යාකතය** කියලා කියන්නේ කුසලයකුත් නොවෙන්නා වූ අකුසලයකුත් නොවෙන්නා වූ විපාකයකුත් නොවෙන්නා වූ ධර්මයක්. ඒක කුසල උනොත් ඉස්සරහදි ධර්මයක් හදන්න එපායැ. ඒක නිසා කුසල වෙන්නේ නෑ. ඒක අකුසලයක් වෙන්නෙත් නෑ. අකුසලයක් උනොත් ඒත් ඉස්සරහදි විපාක හදන්න එපායැ. එහෙම වෙන්නෙත් නෑ. ඒක විපාකයක් වෙන්නෙත් නෑ. ඒ කියන්නේ ඉස්සෙල්ලා හැදුන එකක් නිසා දැන් මතු වෙන එකකුත් නොවෙයි. ඒක නිසා ඒකට කියනවා **කිරියා** කියලා.

**විපාක අව්‍යාකෘතයන්ගේ හෝ ක්‍රියා අව්‍යාකෘතයන්ගේ එකො ඛන්ධො** (එක නාම ගොඩක්. අපි කිව්වා නාම ගොඩවල් 4ක්. ඒ තමයි ‘වේදනා’ ‘සංඥා’ ‘සංස්කාර’ ‘විඤ්ඤාණ’. මේවා විපාක හෝ ක්‍රියා.)

**තිණ්ණන්නං ඛන්ධානං** (අනිත් ස්කන්ධ තුන්ටත්)

**චිත්තසමුට්ඨානානඤ්ච රූපානං** = සිත නිසා හට ගන්න රූපයන්ටත්

**නිස්සයපච්චයෙන පච්චයො** = එකම වේලාවේ නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

මෙහිදී එක සකන්ධයක් පිහිට වෙනවා නිශ්‍රය වෙනවා නාම ධර්ම කොට්ඨාසය තුනකටයි චිත්ත සමුට්ඨානික රූපයන්ටයි. ආන්න ඒ කාරණය කියලා දෙන්න තමයි මම ඉස්සෙල්ලා උපමා ටිකක් කිව්වේ. මේක එක වේලාවේම වෙනවා.

ඒක තවත් විදියකට කියනවා.

2) **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්තසමුට්ඨානානඤ්ච රූපානං නිස්සයපච්චයෙන පච්චයො** = ඒත් විපාක හරි ක්‍රියා හරි (**තයො ඛන්ධා**) සකන්ධ තුනක්

   **එකස්ස ඛන්ධස්ස** = එක සකන්ධයකට සහ

   **චිත්තසමුට්ඨානානඤ්ච රූපානං නිස්සයපච්චයෙන පච්චයො** = චිත්ත ස්මුට්ඨානික රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

අපි කිව්වා ළමයි 10 දෙනෙක් ඉන්නවා කියලා. ඒ ළමයි දහ දෙනා එකම වේලාවේ අම්මා කියලා කථා කරනවා. අම්මා කියලා කථා කරන්නේ අම්මලා දහ දෙනෙකුට නොවෙයි. එක අම්මා කෙනෙකුට. ඒ අම්මා දරුවෝ දහ දෙනාගේම අම්මා. ළමයි දහ දෙනා අම්මා කියලා කථා කරනකොට ඒ දහ දෙනාගේම ආමන්ත්‍රණය apply වෙන්නේ යෙදෙන්නේ එක කාන්තාවකටයි.

**තයො ඛන්ධා** = ස්කන්ධ තුනක්, **එකස්ස ඛන්ධස්ස** = එක සකන්ධයකට සහ **චිත්තසමුට්ඨානානඤ්ච රූපානං** = චිත්ත සමුට්ඨානික රූපයන්ටත් නිශ්‍රය වෙන ආකාරය තමයි ඒකෙන් කියන්නේ.

3) **ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං නිස්සයපච්චයෙන පච්චයො** = ස්කන්ධයෝ දෙන්නෙක් තවත් ස්කන්ධයෝ දෙන්නෙකුට සහ චිත්ත සමුට්ඨානික රූපයන්ට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

ඔය කිව්වේ එක විදියකට. දැන් මම කිව්වා පේළි තුනක්. ඒ තමයි ක්‍රියා සහ විපාක නිශ්‍රය වෙන විදිය. දැන් අපි වෙන අවස්ථාවක් කියනවා. මේකේදී තේරුම් ගන්න ඕනෑ අවස්ථාවයි ධර්මයයි වෙන වෙනම. ඒ ධර්ම වලත් නාම ධර්ම වෙනම රූප ධර්ම වෙනම තේරුම් ගන්න ඕනෑ. ඒවා වැඩ කරන කාලය වෙනම තේරුම් ගන්න ඕනෑ. ඒක නිසා කාලයට සම්බන්ධ දේවල් ධර්ම වලට පටලවා ගන්න හොඳ නෑ. ධර්ම කොට්ඨාස කාල වලට ගෙනියන්න හොඳ නෑ. දැන් මම කාලයක එකක් කියන්නම්.

4) **පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං කටත්තා ච රූපානං නිස්සයපච්චයෙන පච්චයො**

**පටිසන්ධික්ඛණෙ** කියලා කියන්නේ මනුස්ස ආත්ම භාවයකදී මවු කුසක ප්‍රතිසන්ධිය ගන්න වේලාව. මේකේ තිබෙනවා ලස්සන කථාවක්. ඇයි මෙනතැදී කිරියාබ්‍යාකතො කියන්නේ නැතුව **විපාකාබ්‍යාකතො** කියලා කියන්නේ? ඇත්තටම ප්‍රතිසන්ධිය ගන්න අවස්ථාවේදී තිබෙන්නේ විපාකයක්. ඉස්සර වෙලා කරපු කර්මයක් හින්දා ඒකෙ විපාක වශයෙන් තමයි කොතැන හරි උපදින්නේ. ඒ උපදින්නා වූ ඉස්සෙල්ලාම ඇති වෙන්නා වූ හිත ඇත්ත වශයෙන්ම විපාක හිතක්. ඒ විපාක හිත ප්‍රතිසන්ධි සිතක්. ඒක නිසා ඒ විපාක හිත යම් කිසි කුසක රැදෙන ක්ෂණය රැදෙන වේලාව ඒ පටන් ගන්න ක්‍ෂණයට කියනවා **පටිසන්ධික්ෂණය** කියලා. ඒ ප්‍රතිසන්ධි විපාක සිතේ තිබෙනවා නාම ස්කන්ධ

4ක්. එයින් එක ස්කන්ධයක් අනිත් ස්කන්ධ තුනට සහ එවෙලේම පහළ වෙන කර්මජ රූපයන්ට (**කටත්තා ච රූපානං**) නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

බලන්න, එක ස්කන්ධයක් අනිත් ස්කන්ධ තුනකටත් කර්මජ රූපයන්ටයි නිශ්‍රය වෙනවා.

ඊළඟට කියනවා

5) **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස කටත්තා ච රූපානං නිස්සයපච්චයෙන පච්චයො**

පටිසන්ධික්ෂණයෙහි නාම ස්කන්ධයෝ තුන්දෙනෙක් තනි ස්කන්ධයකටයි කර්මජ රූපටන්ටයි නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. හරියට කියනවා නම් අපි මේසයක් ගත්තොත් ඒකෙ කකුල් හතරක් තිබෙනවා. එයින් එක කකුලක් මේසයේ අනිත් කකුල් තුනටත් උඩ තිබෙන තට්ටුවටත් කියන මේ හතරටම එක වේලාවේම පිහිට වෙනවා. ඒවගේම අනිත් අනිත් තුන්දෙනා අනිත් එකට පිහිට වෙනවා. ආන්න ඒ වගේ **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස කටත්තා ච රූපානං නිස්සයපච්චයෙන පච්චයො** කියලා කියනවා.

6) **ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං කටත්තා ච රූපානං නිස්සයන්යපච්චයෙන පච්චයො**

පටිසන්ධික්ෂණයෙහි නාම ස්කන්ධයෝ දෙන්නෙක් අනිත් ස්කන්ධයන්ටත් කර්මජ රූපයන්ටත් නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

7) **ඛන්ධා වත්ථුස්ස නිස්සයපච්චයෙන පච්චයො.**

ප්‍රතිසන්ධි අවසථාවේදී තව සිද්ධියක් වෙනවා. ස්කන්ධයෝ හතර දෙනාම එනම් (වේදනාව සංඥාව සංස්කාරය විඤ්ඤාණය). මෙතැන සංස්කාරය කියලා කිව්වට මෙතැනදී කර්ම හැදෙන්නේ නූැ. මේ කර්මයක් විපාක දෙන ස්ථානයක්. ඒවෙලාවේ ඒ සකන්ධයෝ ටික ඒවත් එක්ක පහළ වෙන වස්තු රූපයට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා එකම වේලාවේ. ඒක නිසා එක වේලාවකදී ඔය නිශ්‍රය ප්‍රත්‍යය භාවය ඇති කරන ධර්ම ස්වභාව තමයි කිව්වේ.

දැන් නාම ධර්ම වලිනුත් අයින් වෙලා ප්‍රතිසන්ධි අවස්ථාවෙනුත් අයින් වෙලා ඒ දෙක පටලවා ගන්නේ නැතුව වෙනමම රූප ධර්ම පිළිබඳව ආශ්‍රයක් කරනවා.

<u>රූප ධර්ම</u>

8) **එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං නිස්සයපච්චයෙන පච්චයො.**

රූප ධර්ම වල තිබෙනවා මහා භූත රූප 4ක්. 'පඨවි රූපය' 'ආපෝ රූපය' 'වායෝ රූපය' 'තේජෝ රූපය'. මේ කියන්නා වූ මහා භූත රූප 4 එක මහා භූත රූපයක් අනිත් මහා භූත තුන්දෙනාට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

9) **තයො මහාභූතා එකස්ස මහාභූතස්ස නිස්සයපච්චයෙන පච්චයො** = මහා භූත රූප තුනක් අනිත් මහා භූත රූපයකට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

10) **ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං නිස්සයපච්චයෙන පච්චයො =** මහා භූත රූප දෙකක් අනිත් මහා භූත රූප දෙකට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

11) **මහාභූතා චිත්තසමුට්ඨානානං රූපානං, කටත්තාරූපානං, උපාදාරූපානං නිස්සයපච්චයෙන පච්චයො** = 'පඨවි' 'ආපෝ' 'තේජෝ' 'වායෝ' කියන මහා භූත හතර දෙනා චිත්ත සමුට්ඨානික රූපයන්ටත් කර්මජ රූපයන්ටත් උපාදාය රූපයන්ටත් නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

දැන් බලන්න, චිත්ත සමුට්ඨානික රූප කියලා කථා කළත් කටත්තා රූප කියලා කථා කළත් මේවා සම්බන්ධ ජීවී ගතියකටයි. සත්වයෙකුට සම්බන්ධයි. චිත්ත ගතිය නැති කර්මජ ගතියත් නැති තැනකට දැන් යනවා අපි රූප ගැන කථා කරන්න. ඒ තමයි බාහිර රූප.

<u>බාහිර රූප</u>

12) **බාහිරං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං නිස්සයපච්චයෙන පච්චයො** = බාහිර රූපයන්ගේ එක් මහා භූත රූපයක් අනිත් මහා භූත රූපයන් තුන්දෙනාට නිශ්‍රය ප්‍රත්‍යය වෙනවා.

13) **තයෝ මහා භූතා එකසස මහා භූතසස නිස්සයපච්චයෙන පච්චයො** = බාහිර මහා භූත රූප තුනක් එක මහා භූත රූපයකට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

14) **ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං නිස්සයපච්චයෙන පච්චයො** = බාහිර මහා භූත රූප දෙකක් අනිත් මහා භූත රූප දෙකට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

අපි දැන් ඒ සඳහන් කළේ බාහිර රූප ගැන. බාහිර රූප චිත්තජ රූප වලට පටලවා ගන්නේ නෑ. චිත්තජ රූප කර්මජ රූප වලට පටලවා ගන්නේ නෑ. උපාදාය රූප මහා භූත රූප වලට පටලවා ගන්නේ නෑ. එහෙම පටලවා ගන්නේ නැත්තේ එහි තිබෙනවා හරිම පැහැදිලි පිරිසිදුව කියන්න පුළුවන් බලන ගතියක්. අපි ඒ නිසා නිහතමානීව ඔය තථාගත බුදුරජාණන්වහන්සේගේ මේ ධර්මය දැකපු ඒ නුවණට අපි ගෞරවයෙන් නමදිමින් තමයි මේක සාකච්ඡා කරන්න ඕනෑ වෙන්නේ.

<u>අහාර සමුට්ඨාන රූප</u>

15) **ආහාරසමුට්ඨානං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං නිස්සයපච්චයෙන පච්චයො** = ආහාරසමුට්ඨාන රූපයන්ගේ එක් මහා භූත රූපයක් අනිත් මහා භූත රූප තුනට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

16) **තයෝ මහා භූතා එකසස මහා භූතසස නිස්සයපච්චයෙන පච්චයො** = ආහාරසමුට්ඨාන මහා භූත තුනක් එක් මහා භූත රූපයකට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

17) **ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං නිස්සයපච්චයෙන පච්චයො** = ආහාරසමුට්ඨාන මහා භූත රූප දෙකක් අනිත් මහා භූත රූප දෙකට නිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා.

<u>උතුසමුට්ඨාන රූප</u>

18) **උතුසමුට්ඨානං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූත රූපානං නිස්සයපච්චයෙන පච්චයො** = උතුසමුට්ඨාන රූපයන්ගේ එක මහා භූත රූපයක් අනිත් මහා භූත රූප තුනට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

19) **තයෝ මහා භූතා එකසස මහා භූතසස නිස්සයපච්චයෙන පච්චයො** = උතුසමුට්ඨාන රූපයන්ගේ මහා භූත තුනක් එක මහා භූත රූපයකට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

20) **ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං නිස්සයපච්චයෙන පච්චයො** = උතුසමුට්ඨාන රූපයන්ගේ මහා භූත රූප දෙකක් අනිත් මහා භූත රූප දෙකට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

**අසඤ්ඤසත්ව රූප** - අසඤ්ඤසත්ව රූප කියලා කියන තැන වෙනම කථා කරන්න ඕනෑ. ඒක චිත්ත සමුට්ඨානික රූප වගේ පොදු තැනක් නොවෙයි. ඒක වෙනමම පැත්තක් නිසා තමයි ඒක වෙන් කරගන්නේ.

21) **අසඤ්ඤසත්තානං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං නිස්සයපච්චයෙන පච්චයො** = අසඤ්ඤසත්වයන්ගේ එක මහා භූත රූපයක් අනිත් මහා භූත රූප තුනට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

22) **තයෝ මහා භූතා එකසස මහා භූතසස නිස්සයපච්චයෙන පච්චයො** = අසඤ්ඤ සත්වයන්ගේ මහා භූත තුනක් එක මහා භූත රූපයකට නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා.

23) **ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං නිස්සයපච්චයෙන පච්චයො** = අසඤ්ඤ සත්වයන්ගේ මහා භූත රූප දෙකක් අනිත් මහා භූත රූප දෙකට නිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා.

**ප්‍රවෘත්ති කර්මජ රූප** - කර්මජ රූප වල තිබෙනවා වර්ග දෙකක්. අපේ පින්වතුන් මේක අහලා තිබෙනවා. නැවත හිතේ දරා ගන්න. එකක් තමයි **ප්‍රතිසන්ධි කර්මජ රූප** සහ **ප්‍රවෘත්ති කර්මජ රූප**. අදට මේ බණ අහන වෙලාවේ අපිට කර්මජ රූප හැදෙනවා. ඒ හැදෙන්නේ ප්‍රවෘත්ති කර්මජ රූප. එක නිසා කියනවා

24) **මහාභූතා කටත්තාව රූපානං, උපාදාය රූපානං නිස්සයපච්චයෙන පච්චයො** = සතර මහා භූතයෝ කර්මජ රූපයන්ටත් උපාදය රූපයන්ටත් යන දෙකටම නිශ්‍රය ප්‍රත්‍යය භාවයෙන් උපකාර වෙනවා. මේක සිද්ධ වෙනවා අසංඥ තලයේ. එහි පළවෙනි රූප වලට ප්‍රතිසන්ධිය කියලා කථා කරනවා. ඊළඟට දිගට පවතින කාලයේ තිබෙන ඒවාට කියනවා ප්‍රවෘත්ති කර්මජ ශක්තියෙන් හට ගන්නා වූ රූප කියලා.

ඊළඟට අපේ හැටියට ගත්තහම චක්ඛායතනය සොතායතනය ඝානායතනය ජිව්හායතනය කායායතනය යන ආයතන පිළිබඳව

25) **චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණස්ස නිස්සයපච්චයෙන පච්චයො** = චක්ඛායතනය කියන්නා වූ ඒ කර්මජ රූපය චක්ඛු විඤ්ඤාණයට නිශ්‍රය ප්‍රත්‍යය භාවයක් දක්වනවා.

(මේක ඇත්ත වශයෙන්ම වෙන්නේ වෙන ක්‍රමයකට. වස්තුවක් පහළ වෙලා පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. මේ විදියටම සෝත ඝාන ජිව්හා කාය සම්බන්ධයෙනුත් සිද්ධ වෙනවා)

දැන් මම මෙච්චර වෙලා මේ පින්වතුන්ට මතක් කළේ එක ධර්මයක් එක වේලාවේ තවත් කෙනෙකුගේ ආධාරය ලබ ලබා තවත් කෙනෙකුට ආධාරයක් උපකාරයක් පිහිටක් වෙන ආකාරය. මේ වගේ ගතියක් තිබෙනවා මේ හේතුවෙන් හටගන්නා වූ අප්‍රමාණ කෝටි ගණන් ලක්ෂ ගණන් වූ වස්තු වල. ඔවුනොවුන්ට උපකාර වෙන, එක ධර්මයක හේතුවෙන් තවත් ධර්මයක් මතුවෙන පිහිටන ගතිය, ඒ ධර්ම වල පිහිටෙන් අනිත් ධර්මය පවතින ගතියක් තිබෙනවා මේ හේතු ඵල ධර්ම වල. කිසිම විදියකින් එක වේලාවක මොහොතවල් දෙහෙක එක ධර්මයක් පිහිටන්නේ නෑ. ඒ තරම් වේගයකින් ඒ තරම් සීඝ්‍රයෙන් මේක කැඩිලා අනිත් තත්වයකට පත්වෙනවා. ඒක නිසා කිසිම තැනක කිසිම දවසක කිසිම මොහොතක හේතුවකින් හටගන්නා වූ දෙයක් පිළිබඳව කිසිම විදියක විස්වාසයක් තබන්න බෑ. ඒ නිසා මේවා සත්වයෝ නොවෙයි. මේවා ජීව ශක්ති නොවෙයි. මේ අපි කථා කරන කට හඬ කාගේවත් සත්වයකුගේ කට හඬක් නොවෙයි. හේතුවකින් ඵලයකින් හටගත්ත චිත්තජ රූප ඍතුජ රූප ආහාරජ රූප කර්මජ රූප සංකලනයක එක්කාසුවකින් ඇතිවෙච්ච දෙයක්.

ඊළඟට ශබ්ද රූපය. තවත් එහෙක පිහිටක් ලබාගෙන මතුවෙන දෙයක්. ශබ්ද රූපය සත්වයෙක් නොවෙයි ජීවයක් නොවෙයි. ආත්මයක් නොවෙයි. පුද්ගලයෙක් නොවෙයි. ශබ්ද රූපයේ තිබෙන්නා වූ ප්‍රඥප්ති ගතිය විඤ්ඤත්ති ගතිය සත්ව නොවෙයි. ජීව නොවෙයි. පුද්ගල නොවෙයි. ආත්ම නොවෙයි. ශබ්දය වෙනයි විඤ්ඤත්තිය වෙනයි. ඒකෙ තිබෙන ඕලාරික ගොරෝසු ගතිය වෙනස්. ශබ්දය හට ගන්නා ස්ථානයත් සත්වයෙක් නොවෙයි ජීවයක් නොවෙයි ආත්මයක් නොවෙයි පුද්ගලයෙක් නොවෙයි. ඒ ශබ්ද හඳන්නා වූ විතක්ක විචාර ආත්ම නොවෙයි පුද්ගල නොවෙයි. ඒ විතක්ක විචාර වැඩ කරන්නා වූ ක්‍රියාත්මක වෙන්නා වූ හිත සත්වයෙක් නොවෙයි ජීවයක් නොවෙයි පුද්ගලයෙක් නොවෙයි ආත්මයක් නොවෙයි. ඒ වාගේම ඒ හිත අරමුණු කරන්නා වූ අරමුණු සත්ව ජීව පුද්ගල මොකක්වත් නොවෙයි. ආත්මයක් නොවෙයි. ඒක නිසා මේ රූප රූප හැටියට වෙන් වෙවී වෙන් වෙවී කඩා හැලි හැලී ආයේ මතු වෙවි මතු වෙවි යනවා. හිත් නාම ධර්ම හැටියට මතු වෙවි මතු වෙවි කඩා වැටි වැටී මැරි මැරී නැවතත් ඇති වෙවී මැරි මැරී යනවා. මේ කිසිම හිතක කිසිම රූපයක කිසිම ශබ්දයක අහගෙන ඉන්නා වූ කිසි කෙනෙකුගේ සෝත විඤ්ඤාණයේවත් ජීව ගතියක් නෑ, ආත්ම ගතියක් නෑ, පුද්ගල ගතියක් නෑ, ස්ථාවර ගතියක් නෑ. හැම තැනම තිබෙන්නේ කැඩී යන බිඳී යන මහා බල ශක්තියක් නැති ගතියක්. හැබැයි හේතුවක සම්භවයෙන් ඇතිවෙනවා. හේතුව නැති වෙනකොට නැතිවෙනවා. මේ බණ අහන හිත්, ඒවේලාවට පවතින කර්මජ රූප, ඒ වේලාවට පවතින චිත්තජ රූප හේතු නැතිව හිස්ව ආපු ඒවා නොවෙයි. හේතු සම්බාරයක් ඇතිව මතු වෙච්ච දේවල්. ඒ හේතු සියල්ලම නැතිවෙලා කැඩිලා යනවා.

දැන් මේ බණ ඇහීම සඳහා අභිධර්ම කථාවක් ඇසීම සඳහා ලෝක සම්මුතියේ හැටියට සත්ව පුද්ගලයෝ හැටියට පිම්බිලා මතුවෙලා ආපු ස්කන්ධ පංචක රාශියක් තැන් තැන් වල රැඳී තිබෙනවා. සම්මත වශයෙන් ගෙවල් වල යම් යම් ස්ථාන වල ස්කන්ධ පහේ ඒවා ක්‍රියාත්මක වෙනවා. මේ පින්වතුන් කොතන ඉඳලා බණ ඇහුවත් ඒ අහන හිත් වලට දෙන ශබ්දය නිස්සය ප්‍රත්‍යය ආශ්‍රයෙන් ගත්තොත් එක්කෙනයි කථා කරන්නේ. එතකොට මේ කථාවට මේ පින්වතුන්ගේ නිශ්‍රය තිබෙනවා. මේ අහගෙන ඉන්න අය සත්ව ගති වලින් ශූන්‍යයයි. ජීව ගති වලින් ශූන්‍යයයි. රඳා පැවතීම් ගතියෙන් ශූන්‍යයයි. අද හිතපු විදියට හෙට කවදාකවත් හිතන්න බෑ. මේ චිත්ත ලක්ෂණය එන්නේ නෑ. ඒවාගේම මේ ක්‍රියාත්මක වෙන ධර්ම ටික මෙතනම කැඩි කැඩී බිඳී බිඳී යනවා. හේතු ඵල ධර්මයන්ගේ තිබෙන ස්වභාවය ඕකයි.

ඒක නිසා කොහේ හෝ වේවා සංසාරයේ ආරම්භයක මේ විදියට නාම ධර්ම රූප ධර්ම වැඩ කරන්න පටන් ගෙන තිබෙනවා. ඒ පටන් ගත්තු පටන් ගැනීම තාම නතර වෙන්නේ නැතුව දිගට දිගට ඇවිල්ල ඇවිල්ලා මේවා දෙකට වෙන් වෙන්නෙත් නැතුව වෙන් වෙලා අහකට යන්නෙත් නැතුව නාම ධර්ම රූප ධර්මයන්ගේ ඇලෙනවා. රූප ධර්ම නාම ධර්මයන්ගේ ඇලෙනවා. වේදනාව සංඥාව ඔක්කොම මේවා එකට එක්කාසු වෙලා එක ගුලියට එක පොදියට නමුත් වෙන් වෙන් ධර්ම ස්වභාව ටිකක් හැටියට තමයි ඔය ඉන්න ඉන්න තැන් වල ඔය ජීවිතිය කියන කට්ටලයේ ඔය ක්‍රියාත්මක වෙන්නේ. ඒක නිසා එක තැනක එක රංචුවකට ස්වභාව ධර්ම සමුදායක් රූප ධර්ම හැටියට නාම ධර්ම හැටියට ක්‍රියාත්මක වෙනවා. ඒක දෙකට බිඳිලා යන්නේ නෑ. ඒක විසිරිලා යන්නේ නෑ. ඒකයි ප්‍රශ්නය. ඒක නවතින්නේ නෑ. ඒක නිසා මේක විසිරුවන්න ඕන. මේක නවත්වන්නා වූ ක්‍රමය තමයි මේ බණ ඇසීම.

ඒක නිසා යම් කිසි දවසක මේ බණ අහගෙන ඉන්න පින්වතුන් මේ හේතු ඵල රංචුවෙන්, මේ හේතු ඵල චිත්ත චෛතසික ධර්ම සමුදායෙන්, රූප ධර්ම සමුදායෙන් මිදෙන්නේ මේ ගොඩට දාල තිබෙන්නා වූ වැරදි අර්ථය, ඒ වැරදි වැටහීම සිතින් බැහැර කරපු වේලාවටයි. සම්පූර්ණයෙන්ම බැහැර කරන්න ඕනෑ. ඒ බැහැර කිරීම තමයි ‘මේක ධර්ම සමුදායක් විතරයි, මේක ජීවයක් නොවෙයි, මේක හේතු වලින් හට ගන්නා ධර්ම මණ්ඩලයක් පමණයි, ආත්මයක් නොවෙයි. ආත්ම ගතියක් මෙහෙ නෑ. ඒ වගේම මේකේ ජීව ගතියක් නෑ. මේකේ සත්වයෙක් නෑ. මේකේ තිබෙන්නේ සත්වයෙක් හැටියට උලුප්පවා කථා කරන ජීවයක් හැටියට කෙනෙක් හැටියට මනුස්සයෙක් හැටියට උලුප්පවා කථා කරන නමුත් ඇත්තටම එහෙම දෙයක් නැති, එක තැන වැඩ කරන්නා වූ විවිධ නාම ධර්ම, විවිධ රූප ධර්මයන්ගේ එක්කාසුවකින් ඇලී තිබෙන ගතියක් විතරයි’ කියලා තේරුම් අරගෙන ඒ ගතියට සත්ව සංඥාව බැහැර කළා නම් ඒ ගතියට ආත්ම සංඥාව බැහැර කළා නම් එතැන කිසි විස්වාසයක් තියන ගතිය නැති කළා නම් එතැන කිසි ස්ථාවරයක් නෑ කියන ගතිය හිතේ තහවරු උනා නම් ඒ වෙලාවට එතැන තිබෙන බැඳීම නැති උනානම් ඒ බැඳීම නැති වීමත් එක්කම ඒ විස්වාසය අත හැරීමත් එක්කම ඊළඟට ඒවා නැතිවෙනකොට ඒ නැති වී යාමම තමයි නිර්වාණ ධාතුව අවබෝධ වෙනවාය

කියලා කියන්නේ. ඒක නිසා එතැනට තිබෙන විස්වාසය නාම ධර්මයන්ට රූප ධර්මයන්ට තිබෙන පිළිගැනීම ඒතැන සත්වයෙක් කියලා සිතෙන් බාර ගැනීමේ ගතිය නැත්තටම නැතිවෙලා කඩා හැලිලා සම්පූර්ණයෙන්ම හේදිලාම යන්න ඕන. ආන්න ඒ නැති වෙන කොට එතැන වැඩ කරපු ක්‍රියාත්මක වෙච්ච වැරදි වැටහීමත් එක්ක කරපු ඒ ඡන්ද රාගය කියපු බලවත් වූ තණ්හාව බලවත් වූ ලෝභය එතැනින් අයින් වෙලා නැත්තටම නැතිවෙලා යනවා. හේතුව ලෝභ කරන්න කියලා කෙනෙක් දෙයක් එතැන හොයා ගන්න බලා ගන්න නැති නිසා. ඒ නැති වීමම තමයි නිර්වාණ ධාතුව කියලා කියන්නේ.

ඒක නිසා අද මේ වේලාවේ මේ පින්වතුන්ට අපි නිශ්‍රය ප්‍රත්‍යය යටතේ කරුණු ගොඩක් කිව්වා. ඒ කියන්නේ රූප ධර්මයන්ගේ වෙනස නාම ධර්මයන්ගේ වෙනස සංකලන අවස්ථාවන්. මේ ධර්ම කොට්ඨාශය එක්ක මේ පින්වතුන් හිතෙන් සම්බන්ධ වෙලා මනසිකාරය පැවැත්වූවානම් මේ පින්වතුන්ට ඒක මහත්ඵල මහානිසංස දායක සසර දුකෙන් මිදී යැමට ඉතාමත් උපකාර වෙන ධර්ම මනසිකාරයක් පිටුවහලක් වෙනවා. ඒ නිසා මේ පිංවතුන්ගේ හිත් වල නීවරණ ධර්ම නැතිවෙලා යටපත් වෙලා විෂ්කම්භනය වෙලා තදංග වශයෙන් ප්‍රහාණය වෙලා මේ වේලාවේදී මේ පින්වතුන්ගේ සිත් මේ මෙනෙහි කිරීමත් එක්ක පැවතුනා නම් ඒක එක මොහොතකින් හරි එක තත්පරයකින් හරි නිවනට ගියා වෙනවා. නිවන් පැත්තට යොමු උනා වෙනවා. ඒ නිසා මේ බණ ඇසීම සැම දෙනාටම මේ වෙනස් වෙනස් නාම ධර්මයන්ගේ ස්වභාව ලක්ෂණ රූප ධර්මයන්ගේ ස්වභාව ලක්ෂණ ඒ වාගේම භූත රූප උපාදාය රූපයන්ගේ ස්වභාව ලක්ෂණ වෙන වෙනම තේරුම් අරගෙන වටහාගෙන ඇලීමෙන් තොර වී බැඳීමෙන් තොර වී ඒවාට විස්වාසය දීමෙන් අයින් වෙලා නිකෙලෙස් හිතක් හදාගෙන සංසාර දුකෙන් හේතු ඵල ධර්ම රාමුවෙන් සංසරණයෙන් විනිර්මුක්ත වෙලා සදා නිවීමෙන් නිවී ශාන්ත නිවීමෙන් නිවී සුන්දර නිවීමෙන් නිවී ගිනියම් වෙන්නා වූ ගතියෙන් තොර වී නිවී සැනසීමෙන් නිවනටම පත්වෙන්න ලැබේවා! නිර්වාණ ධාතුව කියන අසංඛත ලක්ෂණයෙන් යුක්ත වෙච්ච හේතුවක් ඵලයක් නැති සදා නිවීම වූ නිර්වාණ ධාතුව සුවසේම අවබෝධ වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් කිව්වා කර්මජ රූප ඇතිවෙන හැටි සහ වස්තු රූපය කොහොමද ප්‍රත්‍යය වෙන්නේ කියලා හිතට. ස්වාමීන්වහන්ස මම අහලා තිබෙන කථාවක් මේක. බුදුකෙනෙක් පහළ වෙනකොට බෝධියත් බුදුකෙනෙක් එක්කම එකම අවස්ථාවේ පහළ වෙනවා කියලා. ඒවාගේම විවාහ වෙන්නේ ඉන්න කෙනා ඇතුළු යම්කිසි පසුතලයක් හැදෙනවා කියන එක. ස්වාමීන්වහන්සේ එක දවසක් දේශනා කළා

මතකයි ඒ වගේම දේවදත්ත හාමුදුරුවොත් කර්මානුකූලව බුදුහාමුදුරුවෝ බුදුවෙන ආත්මයේදී පහළ උනා කියලා. මම හිතන්නේ සමහර වෙලාවට ඒ කරපු පින් නිසා පහළ වෙන කොටසකුත් තිබෙනවා මොනවා හරි කර්මයක් නිසා අර වගේ දේවලුත් පහළ වෙනවා කියලා. එතකොට ස්වාමීන්වහන්ස අපේ මේ විපාක හිතත් එක්කම අපි බිහිවෙන තැන් සුදුසු පරිසරයන් සකස් වෙනවා වගේ දෙයක්ද තිබෙන්නේ? එතකොට තේරෙනවා අපිට ඒ විපාක හිත හැටියට සකස් වෙන දේවල් අපි ආයිමත් තණ්හාවෙන් බාරගෙන සසර දික්වෙනවා වගේ එකක් තමයි තේරෙන්නේ ස්වාමීන්වහන්ස. නැතුව තිබෙන ලෝකයක අපි ඇවිල්ලා ඉපදුනා කියන එක නොවෙයි. ඒ විපාක හිතත් එක්ක ඒ අවශ්‍ය කරන පරිසරය සකස් වෙනවා වගේ එකක්ද ස්වාමීන්වහන්ස තිබෙන්නේ?

ඒ වගේම මම අහල තිබෙනවා ඒ බුද්ධ රුක්ෂය උනත් තථාගත සාසනය තිබෙන කම්ම විනාශ වෙන්නේ නැහැ කියන එක. ඒ කෙත් යම්කිසි සත්‍යය තාවයක් තිබෙනවද ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - ඒකෙ මහත්තයා මෙහෙමයි තිබෙන්නේ. සෑම බුදුරජාණන් වහන්සේ නමකට දෙව්දත්තර කෙනෙක් පහළ වෙන්නේ නැහැ. වෛරක්කාරයෝ පහළ වෙන්නේ නැහැ. ඕක අපේ ගෞතම බුදුරජාණන්වහන්සේට සංසාරයේ සිද්ධ වෙච්ච සිදු වීමක් නිසා කෙනෙක් ඒ වගේ ආව මිසක නැතිව හැම බුදු කෙනෙකුටම දෙව්දත් කෙනෙක් ඉන්න ඕනේ කියලා එහෙම නියමයක් නෑ. සමහර බෝධි සත්ව වරුන්ට වෛරක්කාර එක්කෙනෙක් ඉන්නවා සමහර වෙලාවට අඩුයි. සමහර වෙලාවට පොඩි පොඩි අය ඉන්නවා. ඒක ඉතින් සාමාන්‍ය හැටියක්. ඒක එකක්.

ඊළඟට අනිත් කාරණය තමයි, යසෝදරා දේවිය වගේ පින්වන්ත චරිත වගේ දේවල් සකස් වෙනවා. මව් කෙනෙක් පිය කෙනෙක් වගේ චරිත බෝධිසත්වයන් වහන්සේගේ පුණ්‍ය බලය වගේම ඒකට අනුයාතව ඒ බෝධිසත්ව චරිතයට ලංව ඒ බෝධිසත්ව චරිතයට සමගාමීව ළඟින් ඉඳගෙන කරපු පුණ්‍යශක්තියක් තමයි විපාක දෙවන්නේ දෙපක්ෂයටම. බෝධි සත්වයන් වහන්සේටත් විපාක දෙවනවා. බෝධි සත්වයන් වහන්සේ ළඟින් ඉඳගෙන අම්මා තාත්තා හැටියට දරුවෝ හැටියට භාර්යාවන් හැටියට හිටපු චරිත කර්ම ශක්තියෙන් තමයි එක්කාසු වෙන්නේ.

අනිත් එක තමයි ආශ්චර්ය ධර්ම හැටියට බුද්ධ ජීවිතියක උපස්ථායක ස්වාමීන්වහන්සේ පහළ වෙලා තිබෙනවා, බෝධීන් වහන්සේ පහළ වෙලා තිබෙනවා එකම වෙලාවේදී. හැබැයි බෝධීන් වහන්සේ විනාස වෙන්නේ නෑ කියලා කියන්නේ නෑ. ඇත්තටම සමහර දේවල් ධර්මය නොදන්නා කම නිසා හදා ගත්ත දේවල්. සියලු දේම අනිත්‍යයයි කියලා කියන තැන බෝධීන් වහන්සේ නිත්‍යයයි කියලා කියනවා. දැන් ඔය දඹදිව පිහිටා තිබුණ ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ අසන්ධිමිත්‍රා කියන අසෝක රජතුමාගේ බිසවක් කටු ගහලා විනාස කළා. ඊට පස්සේ නැවත ඒක පැල උනා එතැන. ඊට පස්සේ කාලයක ඒ ලොව්තුරා බුදුරජාණන්වහන්සේ පිට දීපු බෝධීන් වහන්සේ නැති වෙලා දැනට දඹදිව ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ පිහිටා සිටින තැන යට මොනවගේ මුල් ගතියක් බැහැල තිබෙනවාද කියලා දන්නේ නැහැ. නමුත් දැනට තිබෙන බෝධීන්

වහන්සේ නම් ඉන්දියාවේ හිටපු ශ්‍රී නේරු තුමා ගිහිල්ලා රෝපණය කරපු බෝධීන් වහන්සේ. ඒ බෝධීන් වහන්සේ තමයි දැනට අපිට ගිහිල්ලා ජය ශ්‍රී මහා බෝධීන්වහන්සේ වදින්න පුදන්න තිබෙන්නේ. ඒකෙ වරදක් නෑ. හේතුව ඒ ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ ඇත්තටම එතැන පිහිටා තිබුණ බව හොඳටම හොයා ගෙන තිබෙනවා. සමහර විට යට මුලක් එහෙම තිබෙනවද කියන කථාව නම් දන්නේ නෑ. නමුත් දැනට තිබෙන්නේ නම් ශ්‍රී නේරු තුමා රෝපණය කරපු එක.

ඊළඟට ඒ පරම්පරාවෙන් එන්නා වූ බෝධියක් හැටියට තිබෙන්නේ අනුරාධපුරයේ ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ. ඊළඟට ඒකෙ ශාඛාවක් හැටියට තිබෙන්නේ, පරණම බෝධීන් වහන්සේ හැටියට තිබෙන්නේ ජේතවනාරාමයේ තිබෙන ආනන්ද බෝධිය. ඒ ජේතවනාරාමයේ තිබෙන ආනන්ද බෝධියත් දැන් වයෝවෘද්ධයි. ඔය විදියටයි තිබෙන්නේ. දැන් බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ශරීරය නැති වී ගියා. ඊළඟට උන්වහන්සේගේ ඒ රාහුල ස්වාමීන්වහන්සේ යසෝදරා දෙවීන් වහන්සේ පියතුමා නැති වී ගියා. අනිත් සියලු දෙනාමත් ආනන්ද ස්වාමීන්වහන්සේත් පිරිනිවන් පෑවා. මාතෘ දිව්‍යපුත්‍රයාණන් වහන්සේ විතරයි තාම ඉන්නේ. ඉතින් ඒවගේ නැතිවෙන දේවල් තිබෙත් දී අර බෝධියට ස්ථාවරයක් දෙන්නේ නෑ .

නමුත් උන්වහන්සේ වැඩ ඉන්න කාලයේ ඒවා පහළ වීම සිද්ධ වෙනවා. දැන් බලන්න ජේතවනාරාමයේ සිද්ධිය. හොඳට බලන්න. ජේතවනාරාමයේ පහළ වෙනවා සුවඳ ගන්ධ කුටිය. ඒක හැදුවේ හඳුන් වලින්. අනාථපිණ්ඩික සිටු තුමා හඳුන් ලීයෙන් හැම වේලාවේදීම සුවඳ හමන්ට බුදුරජාණන්වහන්සේට ගන්ධ කුටියක් හදලා පූජා කළා. නමුත් ඒ ගන්ධ කුටිය බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවාට පස්සේ වෙන කිසි කෙනෙකුට ඒ ගන්ධ කුටිය පාවිච්චි කරන්න පිං නෑ. කවුද පාරමී පිරුවේ බුදුවෙන්න? කවුද පාරමී පිරුවේ ගන්ධ කුටියක් පාවිච්චි කරන්න? කවුද ඒ තරම් මහා විසාල ශක්තියක් වැඩුවේ? ඒක මීයෝ කාලා හරි ගින්දරට පත්තුවෙලා හරි ඒක විනාස වෙලා ගියා. සමහර අයට ඇත්ත වශයෙන්ම පාවිච්චි කිරීමට තබා ඒවගේ දෙයක් තිබුණද කියලා දකින්නවත් පින නෑ. ඇත්තට සිද්ධ උනේ එච්චරයි. ඒක නිසා යම් යම් හේතුවලින් ඒ කියන්නේ මීයෝ කෑවා පහන් වැටි දාලා ඒක ගිනි ගත්තා, අනිත් අය ගිනි තිබ්බා කියලා කියනවා. නමුත් ඒකෙ තවත් එකක් තමයි ඒ විහාරය පාවිච්චි කරන්න සුදුසු පිං තිබෙන්නා වූ කෙනෙක් නෑ. ඒ පුණ්‍ය වාසනාව පාරමී ගුණ තිබෙන අය නෑ.

ඊළඟට මාළිගාව බලන්න. මාළිගාවත් වල් බිහි උනා. අඩු තරමේ පොඩි ගඩොල් වලින් වට වෙච්ච තැනක ගිහිල්ලා රැඳිලා ඉන්න වහළ කැල්ලක් වත් තිබෙන එකක්වත් දැන් නෑ. ඒ පින්වන්තයන්ට ලැබුණ දේවල් එහෙමම ඒ අය නැති වෙනකොටම ඒවා අභාවයට යනවා. ඒක තමයි හැටි.

ඒක නිසා ඒ පින්වන්තයෝ පහළ වෙනකොට බෝධියද මාළිගාවල්ද ඕවා පහළ වෙනවා. ඕක අපිටත් සාධාරණයි. විශේෂයෙන්ම පුණ්‍යවන්ත තථාගතයන් වහන්සේගේ ජීවිතියට විශේෂයෙන් සාධාරණ වෙනවා. ඒක නිසා ආශ්චර්ය අද්භූත ධර්ම තිබෙනවා. අවසාන

වශයෙන්  මේක කියන්න ඕනෑ. බුදුරජාණන්වහන්සේගේ ජීවිතියට විශේෂ සිදු වීම් තිබෙනවා. ඒවා අනිත් අයගේ ජීවිත වලට වෙන්නේ නෑ. බුදුරජාණන්වහන්සේගේ  ජීවිතියේ පුදුම පිං ගොඩක් තිබෙන්නේ. පුදුම ධර්ම ගොඩක් ධර්ම ශක්තියක් තිබෙන්නේ. හිතන දේවල්  හැම දේම සිද්ධ වෙනවා. උන්වහන්සේට තිබෙනවා කාම භාග්‍ය කියලා එකක්. ඒ කියන්නේ  කැමති  දේ මොකක්ද ඒක හම්බ වෙනවා. නමුත් වෙලා තිබෙන්නේ ලෝකයේ තිබෙන දේවල් වලට තථාගතයන්  වහන්සේ  කැමති  නෑ. කැමැත්ත තිබෙනවා නම් කන්දක් උනත්  රත්තරන් වෙනවා.  ඒ තරම් භාග්‍යයක්  තිබෙනවා.  නමුත් උන්වහන්සේ ඒවාට කැමති නෑ.  නමුත් කාම භාග්‍ය කියන වාසනා ගුණය තිබෙනවා. ඒවගේම අවබෝධ කරගත්තු දේවල් ගොඩයි. අනන්තයි.  හැබැයි  අපිට සසර දුකෙන් මිදී  යන්න අපිට පුළුවන් ප්‍රමාණය පමණයි  දේශනා කළේ.  ඒක නිසා  තව  නොදෙසපු දේවල් තව ගොඩාක් තිබෙනවා. ඔය අතර ඕවාට  සම්බන්ධ  දේවල් තිබෙනවා  කියලා  මම පෞද්ගලිකව විස්වාස කරනවා. පොත පතක නෑ. ඒක මගේ විස්වාසය. ඔය ටික තමයි මට මේ වේලාවේදී කියන්න තිබෙන්නේ.  කාරණය පැහැදිලි වෙන්න ඇති කියලා මම විස්වාස කරනවා. තෙරුවන් සරණයි!

<u>Bruno මහත්මයා</u> - හොඳට පැහැදිලි උනා ස්වාමීන්වහන්ස. මම නම් ලොකු පිනක් කරලා තිබෙනවා කියලා හිතනවා ස්වාමීන්වහන්සේගෙන් බණ අහන්නත්. මේ කාලයේදී මේ වගේ ධර්මයක් අහන්න ලැබීම ලොකු පිනක් හැටියට තමයි මම සලකන්නේ ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ජයන්ත මහත්මා</u> -  අදට සාකච්ඡාව  මෙතැනින් නිමා කරමු. නිමා කිරීම සඳහා ඉතාමත් කෘතවේදීව පුණ්‍යානුමෝදනා කරමින් ගෞරවණීය ස්වාමීන්වහන්සේ  වෙත අපි යොමු වෙනවා.  තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස!

<u>ස්වාමීන්වහන්සේ</u> - තෙරුවන් සරණයි!  අදත්  අපි මේ කාලය වෙන් කරගෙන නැවත ධර්ම සාකච්ඡාවක් අපි ඉදිරිපත් කර ගත්තා. ධර්මය ඇසීමෙන් හිතීමෙන් මෙනෙහි කිරීමෙන් අපි නිකෙලෙස් හිත් වලින් උපදවා ගත්ත මේ කුසල ධර්මයන්ගේ බලයෙන් ශක්තියෙන් අපේ පින්වත්  අසාගෙන  සිටින මේ ධර්ම මණ්ඩලයේ සිටින සැම දෙනාටමත් විශේෂයෙන් ලලිත් මහත්මයාටත් ඒ පවුලේ සැම දෙනාටමත් නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! ඒවාගේම අපේ ජයන්ත මහත්මයා ප්‍රශ්න ඇසූ Bruno මහත්මයා ඇතුළු මේ අසාගෙන සිටින ළඟ දුර වශයෙන් සිටින මෙරට පිටරට වශයෙන් සිටින සැම සියළු දෙනාටම මේ උතුම් ධර්මය සත්පුරුෂ ආශ්‍රය ළං කරගන්නත් සත්පුරුෂයන්ගේ දේශනාවල් අසන්නත්, දේශනාවල් වලින් අසත්පුරුෂ ධර්මයට ළං නොවෙන්නත් සත්පුරුෂ ධර්මයම බේරිලා තමන්ගේ කන වැකෙන්නත් හේතුවේවා! අසත්පුරුෂයන් දකින්න අහන්න හිතන්න මූණ ගැහෙන්න නොලැබේවා! සත් පුරුෂයෝ දකින්න හිතන්න මෙනෙහි කරන්න ආශ්‍රය කරන්න ලැබේවා! සත් පුරුෂයන්ගේම වචන හඬ විස්තර ධර්මයන්ම මේ හිත්වලට ලැබේවා! ඒවගේම බෝධිපාක්ෂික ධර්ම නිවැරදි ලෙස සැමදෙනාගේම සිත් වලට වඩා ගන්න ලැබේවා! ආර්ය ධර්මයේ ගමන් කොට සැම දෙනාටම කෙළවර චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ වී

නිකෙළෙස් සිත් වලින් සංසාරයෙන් මිදී නිවනින්ම සැනසෙන්න ලැබේවා! කියලා මෛත්‍රීයෙන් පින් දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං – පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභේන මයා ලද්දං – පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං – ආගතං පටිපාටියා
සද්ධා ශීලං දයා වාසං – බුද්ධ පුත්තං නමාමහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.